*සියලු ම හිමිකම් ඇවිරිණි]*
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ලංකා බැංකුව සඳහා අභ්‍යාසලාභී උසාවි ලිපිකරුවන් තෝරාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය සහ වේග පරීක්ෂණය - 2016

## (01) ලිඛිත පරීක්ෂණය

පැ. දෙකයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** (i) 'මුල් අවස්ථා අධිකරණ' යනු කවරේ ද?

(ii) දිසා අධිකරණයට මුල් අවස්ථා අධිකරණ බලය ඇති කාරණා දෙකක් සඳහන් කරන්න.

(iii) සමථ මණ්ඩලයක සභාපතිවරයා විසින් ඉල්ලුම් පත් බාර නොගන්නා ආරවුල්කරුවන් තිදෙනා කවරහු ද?

(iv) සමථ මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන සහතික මොනවා ද?

(v) ආරවුල්කරුවකුට සමථ මණ්ඩලය මගින් නිරවුල් කිරීම පිළිබඳ නියමයන් නිකුත් කරන්නේ කවර අවස්ථාවේ දී ද?

(vi) මහේස්ත්‍රාත් අධිකරණයක මූල්‍ය අධිකරණ බලය කුමක් ද?

(vii) ශ්‍රී ලංකා ජනරජයේ උත්තරීතරම සහ අවසානාත්මක ලේඛනෝපගත කිරීමේ අධිකරණය කවරේ ද?

(viii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ වැරදි විභාග කරනු ලබන අධිකරණ දෙක කවරේ ද?

(ix) සිවිල් නඩුවක සේවාදායකයකු විසින් තමා නියෝජනය කිරීම සඳහා ලියාපදිංචි නීතිඥවරයකු පත් කරනුයේ කවර ආකාරයකට ද?

(x) ප්‍රධාන සිවිල් නඩු වර්ග දෙක කවරේ ද?

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** (i) 'ක්‍රියාවෙහි යෙදවීමේ ආඥා පත්‍රය (Write of Execution)' යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද?

(ii) තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවෙහි යෙදවීම යන්න පැහැදිලි කරන්න.

(iii) තහනමට පැවරීමෙන් නිදහස් දේපළ කවරේ ද?

*(ලකුණු 20 යි)*

**3.** (i) 'ආඥාව' සහ 'නඩු තීන්දුව' අතර වෙනස කවරේ ද?

(ii) නඩුවක තීන්දුවෙන් පසු අභියාචනයක් ගොනු කළ හැකි වන්නේ කවර දින ගණනක් ඇතුළත දී ද?

(iii) අභියාචනා පෙත්සමක ඇතුළත් වියයුතු අවශ්‍ය කාරණා කවරේ ද?

*(ලකුණු 20 යි)*

**4.** (i) සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව ගොනු කළ යුත්තේ කවර අවස්ථාවේ ද?

(ii) සිතාසියක නිශ්චිතව සඳහන් කළ යුතු කාරණා කවරේ ද?

(iii) සාක්ෂිකරුවන්ගේ වියදම් සඳහා ගෙවීම් සැපයීම අවශ්‍ය වන්නේ දැයි කෙටි සටහනක් ලියන්න.

*(ලකුණු 20 යි)*

**5.** (i) අන්තිම කැමති පත්‍රයක් නොතබා මියයන අයකුගේ දේපළ පරිපාලනය කිරීම අනිවාර්යය වන්නේ කවර අවස්ථාවේ ද?

(ii) අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් සඳහා අයදුම් කළ හැක්කේ කවර පුද්ගලයන්ට ද?

(iii) ප්‍රමාණ කළ ඉල්ලීම් සම්බන්ධයෙන් අධිකරණයක ගොනු කිරීම සඳහා දිවුරුම් පෙත්සමක් සකස් කරන්න.

*(ලකුණු 20 යි)*

* * *

*සියලු ම හිමිකම් ඇවිරිණි]*
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ලංකා බැංකුව සඳහා අභ්‍යාසලාභී උසාවි ලිපිකරුවන් තෝරාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය සහ වේග පරීක්ෂණය - 2016

## (02) වේග පරීක්ෂණය

විනාඩි දහයයි

වේගය : විනාඩියකට වචන 25

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ මුල පිටුවේ ඇති I කොටස නිවැරදිව පරිගණකයෙන් ටයිප් කිරීම මෙම පරීක්ෂණය සඳහා ප්‍රමාණවත් ය.
* කාලය ඉතිරිව තිබේ නම් පමණක් දෙවන පිටුවේ දැක්වෙන II කොටස මුල සිට ටයිප් කරන්න. තවදුරටත් කාලය ඉතිරිව තිබේ නම් දෙවන පිටුවේ ඇති II කොටසම නැවත වරක් මුල සිට ටයිප් කරන්න. ලකුණු ලබාදීමේ දී ඒ පිළිබඳව සලකා බලනු ලැබේ.
* පළමු පිටුවේ දැක්වෙන I කොටස නැවත වරක් ටයිප් කිරීම වෙනුවෙන් ලකුණු නොලැබේ.

### I කොටස

ශ්‍රී ලංකාවේ චෙක්පත් භාවිතය සම්බන්ධ වැදගත් සිද්ධියක් ලෙස ඒ සම්බන්ධයෙන් පිහිටුවන ලද ස්වයංක්‍රීය නිෂ්කාෂණාගාරය හැඳින්විය හැකි ය. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙතෙක් කර ගෙන ගිය නිෂ්කාෂණාගාර පහසුකම් නවීකරණය කිරීමක් ලෙස හැඳින්විය හැකි ය. කලින් පැවති ක්‍රමය අනුව චෙක්පත් නිෂ්කාෂණයේ දී කෙරෙනුයේ එක් එක් බැංකු විසින් අනෙක් බැංකු වෙත ලියන ලද චෙක්පත් බැංකු අනුව ගොනු කොට ඒ ඒ බැංකුවල නියෝජිතයන් විසින් මහ බැංකුවේ නිෂ්කාෂණාගාරය වෙත එවීමයි. එහිදී චෙක්පත් මාරු කර ගන්නා අතර මහ බැංකු නිලධාරියකු විසින් එක් එක් බැංකු සඳහා බැංකුවෙන් පිටතට ගලා ගිය සහ බැංකුව තුළට ගලා ආ මුදල් සහ අවසාන ශේෂය පිළිබඳ විස්තර පත්‍රිකාවක් සකස් කරනු ලැබේ. මෙහිදී එක් එක් බැංකුවේ මුළු ලැබීම් සහ මුළු ගෙවීම් සමාන වීම අවශ්‍ය වේ.

මෙම ක්‍රමය පරිගණක යන්ත්‍ර ආශ්‍රයෙන් ස්වයංක්‍රීය කිරීම නව ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයකි. මෙවැන්නක් කිරීම අවශ්‍ය යැයි තීරණය කරනු ලැබුවේ 1984 වර්ෂයේ දී ය. ඒ වන විට ලෝකයේ බොහෝ රටවල වර්ෂ ගණනාවක් තිස්සේ මෙම ක්‍රමය භාවිත කරමින් පැවතිණි. ලෝකයේ පළමුවන ස්වයංක්‍රීය නිෂ්කාෂණාගාරය පිහිටුවන ලද්දේ 1972 දී ඇමෙරිකාවේ කැලිෆෝනියා රාජ්‍යයේ ය. පිලිපීනය, සිංගප්පූරුව, හොංකොං, තායිවාන්, මැලේසියාව, ඉන්දියාව වැනි ආසියානු රටවල් ද මෙම ක්‍රමය අනුව චෙක්පත් නිෂ්කාෂණය කිරීම වර්ෂ ගණනාවක් තිස්සේ කර ගෙන යනු ලබයි. නව ක්‍රමය යටතේ පරිගණක යන්ත්‍රය මගින් අලුතින් නිකුත් කරන චෙක්පත්වල පහළම කොටසේ චුම්බක තීන්ත අක්ෂරවලින් සටහන් කොට ඇති විස්තර කියවා එම දත්ත පරිගණක තැටි ලිපිගොනුවල තැන්පත් කරයි.

(කාලය ඉතිරිව තිබේ නම් දෙවන පිටුවේ ඇති II කොටස මුල සිට ටයිප් කරන්න.)

[ 2 වැනි පිටුව බලන්න.

**II කොටස**

ග්‍රාමීය අංශය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා සුදුසු ආයතනික රටාවක් බිහි කිරීමෙන් ද මෙතෙක් මහ බැංකුවේ යෝජනා පරිදි පිහිටුවන ලද මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සංවර්ධන මූල්‍ය සංස්ථාව, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව යන ආයතනයන්හි කාර්යභාරය පුළුල් කිරීමෙන් ද ග්‍රාමීය ණය පාලනය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමෙන් ද ග්‍රාමීය ණය අංශයෙහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා මහ බැංකුව තුළ ආයතනික රටාව සකස් කිරීමෙන් ද මෙතෙක් මහ බැංකුව ගෙන ඇති පියවර වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා ග්‍රාමීය අංශය තුළ මුල් බැස ගෙන ඇති ඇතැම් දුර්වලතා මග හැරවීම සඳහා පියවර ගැනීම මහ බැංකුවේ ප්‍රධානතම වගකීමයි. එය ග්‍රාමීය අංශවල ප්‍රමාණාත්මක වශයෙන් ප්‍රාග්ධන සම්පාදනය වැඩි කිරීමටත්, එහි ඵලදායිතාව හා ගුණාත්මක අගය වැඩි කිරීමටත් අනිවාර්යයෙන්ම දායක වනු ඇත.

බොහෝවිට ගැමියන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගය කෘෂි බෝග වගාවට සීමා වී ඇත. ඇතැම් වියළි කලාපීය ගොවීන්ගේ එකම ආදායම් මාර්ගය කවුපිසර හේන් වගාවයි. වගා කටයුතු එක් කන්නයකට පමණක් සීමා වී ඇත. තම ප්‍රධාන ආදායම් මාර්ගයට අමතරව වෙනත් ආදායම් මාර්ග සලසා ගැනීමටත්, හේන් ගොවිතැන වැනි අස්ථිර ගොවිතැන් ක්‍රම වෙනුවට භූගත ජලය භාවිත කරමින් ස්ථිර ගොවිපොළ ක්‍රමයක් ආරම්භ කිරීම වැනි නව ආයෝජන ක්‍රියා මාර්ග තෝරා බේරා ගැනීමටත් ගොවියා තුළ ඇති අඩු අවබෝධය ඔවුන් මුහුණ දී ඇති ප්‍රධානතම ගැටලුවකි. නව ආයෝජන මාර්ග පිළිබඳව අදහස් ලබා ගත්ත ද ඒ සඳහා මූල්‍ය පහසුකම් සොයා ගැනීම වෙනුවෙන් විවෘත වූ ආයතනික රටාව පිළිබඳව ගැමියා තුළ ඇත්තේ අඩු අවබෝධයකි. මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ඇති ඉතාම කෙටි මාර්ගය වන ආයතනික නොවන අංශය ඔවුන්ගේ අවධානයට හසු වූ එකම මාර්ගයයි.

(තවදුරටත් කාලය ඉතිරිව තිබේ නම් මෙම පිටුවේ ඇති II කොටස නැවත වරක් මුල සිට ටයිප් කරන්න.)

***